# ආරක්ෂක සේවා සැපයීම - 2025/2026

## ඌව පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව - බදුල්ල

ඌව පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන පහත සඳහන් ළමා සංවර්ධන ආයතනවලට 2025.11.01 දින සිට 2025.12.31 දින දක්වා සහ 2026.01.01 සිට 2026.12.31 දක්වා ආරක්ෂක සේවා සැපයීමට ආරක්ෂක සේවාවන් සපයන පිළිගත් ආයතන සහ පුද්ගලයින්ගෙන් ලංසු කැඳවනු ලැබේ.

| අනු අංකය | ළමා සංවර්ධන ආයතනය | ලංසු ආකෘති පත්‍ර ගාස්තුව (රු:) | ආපසු ගෙවන ලංසු සුරක්ෂණ ගාස්තු (මුදලින්) (රු:) |
|---|---|---|---|
| 01 | සහතික කල පාසල - කැප්පෙටිපොල | 3,000.00 | 25,000.00 |
| 02 | මදුරුකැටිය සමාධි ළමා සංවර්ධන මධ්‍යස්ථානය - මොනරාගල | | |
| 03 | සුරක්ෂා බාලක රැඳවුම් මධ්‍යස්ථානය - බණ්ඩාරවෙල | | |

01. ඉල්ලුම්කරු ශ්‍රී ලංකා ව්‍යාපාර නාම ලියාපදිංචි කිරිමේ ආඥා පනත හෝ සමාගම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ලියාපදිංචි ආයතනයක් හෝ පුද්ගලයෙකු විය යුතු අතර, අසාධු ලේඛණගත නොවූ සේවා සපයන්නෙකු විය යුතුය.

02. ඉහත වගුවේ සඳහන් පරිදි ලංසු ආකෘති පත් ඌව පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවෙන් මිලදී ගැනිමට හැකිවන අතර, ලංසු ආකෘති පත්‍ර නිකුත් කිරිම **2025.10.03 දින සිට 2025.10.16 දින ප.ව. 1.30 දක්වා** නිකුත් කරනු ලබන අතර, 2025.10.17 **ප.ව. 2.30** ට ඌව පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ රැස්විම් ශාලාවේදී ලංසුපත් විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය. නියමිත දින නියමිත වේලාවෙන් පසුව ලැබෙන ලංසුපත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු පිළිගැනිම, ප්‍රතික්ෂේප කිරිම හෝ කොටසක් පිළිගැනිමේ අයිතිය ප්‍රසම්පාදන මණ්ඩලය සතුය. වැඩිදුර විස්තර සඳහා දුරකථන අංක 055 2231209 විමසිම් කල හැකිය.

03. ලංසු ආකෘති පත්‍ර ගාස්තු /ලංසු සුරක්ෂණ ගාස්තු වගුවේ සඳහන් පරිදි ඊට අදාල මුදල පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා කොමසාරිස්ගේ මහජන බැංකුවේ ජංගම ගිණුමේ අංක 269-1-001-7-8440334 තැන්පත් කර ඊට අදාල ලදුපත් සතියේ වැඩ කරන දින පෙ.ව. 9.00 සිට ප.ව.3.00 දක්වා පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මුදල් සහකාර වෙත භාරදී ඒ සඳහා කුවිතාන්සියක් එම කාර්යාලයෙන් ලබා ගෙන එම කුවිතාන්සි මුල් පිටපත ලංසු ආකෘති පත්‍ර සමඟ ඉදිරිපත් කල යුතුය.

04. එමෙන්ම ආපසු ගෙවන ලංසු සුරක්ෂණ ගාස්තුව වෙනුවෙන් බැංකු ඇපකරයක් ඉදිරිපත් කරන්නේ නම් ඒ සඳහා ඉහත වගුවේ සඳහන් වටිනාකම මෙන් දෙගුණයක් 2025.12.30 දින දක්වා වලංගු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද පිළිගත් වාණිජ බැංකුවක් මගින් ලබාගත් බැංකු ඇපකරයක්, ඌව පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා කොමසාරිස් නමින් ඉදිරිපත් කල යුතුය. තවද ලංසු ඉදිරිපත් කිරිම සඳහා වන කොන්දේසි හා ලංසු ඇගැයිමේ දර්ශක ලංසු ආකෘති පත් ලබා ගැනිමට පෙර එම ලියකියවිලිද පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේදී පරික්ෂා කිරිමට හැකිය.

**06. සියළුම ආයතන සඳහා සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව මඟින් ලබා ගන්නා ලද පොදු කොන්ත්‍රාත් ගිවිසුම ඉදිරිපත් කළ යුතුය. (PCA 03 ආකෘතිය)**

07. පූර්ව ලංසු සාකච්ඡාව 2025.10.15 දින පෙරවරු 10.00 ට ඌව පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ශ්‍රවනාගාරයේදී පැවැත්වේ. ඒ සඳහා ලංසු කරුවන් සහභාගීවීම අනිවාර්ය වේ.

සභාපති,

දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය,

ඌව පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව ,

අංක 301, ආර්.එච්.ගුණවර්ධන මාවත,

බදුල්ල.

දුරකථන අංකය:- 055 – 2231209

ෆැක්ස් අංකය:- 055 – 2231209